# 18 සංස්කෘතිය අගයමු සමාජ ධර්ම සුරකිමු

අනුබුදු මිහිඳු මහ රහතන් වහන්සේ ප්‍රමුඛ ධර්ම දූත පිරිස විසින් අපට දායාද කොට දෙන ලද බුදු දහමත් එම දහම සුරකිමින් පතුරුවා හැරීමට ඇප කැප වූ භික්ෂු භික්ෂුණී සංවිධානත් එම දහම වඩාත් ආකර්ෂණීය ලෙස අප වෙත ගෙන ආ කලා ශිල්ප සමූහය හා භාෂා සාහිත්‍යයත් මෙරට ජන සමාජය උතුම් සාරධර්ම සමූහයකින් පෝෂණය කර ඇති බව පැහැදිලි ය. ඒ අනුව ශ්‍රී ලාංකික ජනතාවගේ සංස්කෘතිය සුවිශේෂ ලක්ෂණ රාශියකින් සමන්විත වෙයි. දියුණුයැයි සම්මත ව ඇති ලෝකයේ ඇතැම් ජන සංස්කෘතීන්හි දක්නට නො ලැබෙන මෙම සුවිශේෂී ලක්ෂණ නිසා ම මෙරට පොදු ජනයාගේ හැදියාව බොහෝ දේශීය හා විදේශීය විද්වතුන්ගේ අවධානයට ද ඇගයීමට ද ලක් ව තිබේ. එම ලක්ෂණවලින් කිහිපයක් පමණක් අපි සාකච්ඡා කරමු.

## කළගුණ සැලකීම

කළගුණ සැලකීම උසස් මිනිස් ගතියකි. බුදුරජාණන් වහන්සේ හා උන්වහන්සේගේ ගිහි පැවිදි ශ්‍රාවක ශ්‍රාවිකාවන් ද අවවාදයෙන් මෙන් ම ආදර්ශයෙන් ද උගන්වා ඇති උතුම් ගුණයකි. ලෝකයෙහි කළගුණ දන්නා කළගුණ සලකන මිනිසුන් දුර්ලභ යැයි බුදුදහම පෙන්වා දෙයි. තමාට තමාගේ යහපතට දියුණුවට මඟ පෙන් වූ ආධාර උපකාර කළ ගුරු දෙගුරුන්ට ඥාති මිත්‍රාදීන්ට අසල් වැසියන්ට ඉත සිතින් කළ ගුණ දැක්වීම, ප්‍රත්‍යුපකාර කිරීම එක් අතකින් අපගේ යුතුකමක් වෙයි. බුදුදහම එබඳු මිනිස් යුතුකම් ඉතා ඉහළින් අගය කරයි. මව්පියෝ දරුවන්ට බොහෝ උපකාර ඇත්තෝ ය. ඔවුහු අප හදා වඩා ගනිති. රස ගුණ අහරින් පෝෂණය කරති. සිප්සතර උගන්වති. සමාජයට ඉදිරිපත් කරති. හොඳ නරක කියා දෙති. ඒ මාපියන් නිසා මෙලොව එළිය දුටු අපට ඔවුන්ගෙන් අව්‍යාජ ආදරය ද, සැබෑ කැපවීමෙන් යුතු ආරක්ෂාව ද, අත්‍යවශ්‍ය වූ පෝෂණය ද ලැබෙයි. එබැවින් ඔවුන් මහලු වියට පත් වූ විට ද රෝගී ව දුර්වල වී සිටින විට ද කළගුණ සැලකිය යුතු ම ය. දිරාපත් වූ, තරුණ විය පසු කළ මවට හෝ පියාට කළගුණ සැලකීම් වශයෙන් අවශ්‍ය යුතුකම් ඉටු නොකරන්නා වසලයෙකැයි බුදුරජාණන් වහන්සේ වදාළහ.

මේ ආකාරයෙන් ම සිසුන් විසින් ගුරුවරුන්ට ද කළගුණ සැලකිය යුතුයි. ගුරුවරු අපට ශිල්ප ශාස්ත්‍ර උගන්වති. අප ආදරයෙන් රැකබලා ගනිති. යහපත අයහපත කියා දෙති. එම ගුරුවරුන්ට අපට හැකියාව ලද විට අප ද ආපසු උපකාර කළ යුතු ය. බුදුදහම එසේ සිසුන් විසින් ගුරුවරුන්ට ප්‍රත්‍යුපකාර කළ යුතු ආකාරය ද උගන්වයි. ඒ ගුරු දෙගුරුන් ජීවත් ව සිටිය දී මෙන් ම මිය ගිය පසුව ද පින් පෙත් දීමෙන් කළගුණ දැක්විය යුතු ය. මෙසේ සෙසු ඥාතීන්ට ද හිත මිතුරන්ට ද අසල්වැසියන්ට ද කළගුණ දැක්වීම උතුම් මිනිස් ගුණයක් වේ. සමාජයක් වශයෙන් එක් ව ශක්තිමත් ව ඉදිරියට යා හැක්කේ එවිටයි. එම නිසා මිනිස් සබඳතා තහවුරු වෙයි. ගුරු දෙගුරුන්ගේ ද මාපිය හිත මිතුරන්ගේ ද ආශිර්වාදය අපට ලැබෙයි.

බුදුරජාණන් වහන්සේ කළගුණ සැලකීම ආදර්ශයෙන් පෙන් වූ අවස්ථා රැසකි. තමන් වහන්සේට උතුම් බුදු බව ලැබීමට පිහිට වූ ඇසතු ගස දෙස සතියක් බලා හිඳිමින් අනිමිස ලෝචන පූජාව කළ උන්වහන්සේ නිසා ඒ ගස බෝධි වෘක්ෂය බවට පත් ව අදත් ගෞරව සම්මාන ලබයි. තමන් වහන්සේ මෙලොවට බිහි කළ මවට දහම් දෙසා සුවපත් කිරීමට තව්තිසාවට වැඩම කිරීම, තමන් වහන්සේ රැක බලා ගත් කිරිමව වූ මහා ප්‍රජාපතී ගෝතමී තෙරණිය පිරිනිවන් පෑ විට එම ආදාහන පෙරහැරෙහි පසු ගමන් කිරීම, තම පියතුමන් හා ඥාතීන් සුවපත් කරනු පිණිස කිඹුල්වත් නුවරට වැඩ දහම් දෙසීම, අභිනික්මන් කළ දා උපකාර කළ ඡන්න ඇමති පැවිදි කොට නිවන් මඟ පෙන්වීම ආදිය මීට නිදසුන් ය.

බුදු දහමින් ද බුදු සිරිතින් ද මෙසේ උගන්වා ඇති කළගුණ සැලකීමේ ගුණය මහින්දාගමනයෙන් පසු මෙරට ජනයා අතර ප්‍රචලිත වූයේ ය. අපේ ගැමියෝ ද ගුරු දෙගුරුන් දේවත්වයෙන් සලකා ප්‍රත්‍යුපකාර කළහ. විටෙක තම ගොවිතැන් ආදියට උපකාරී වූ තිරිසන් සතුන්ට පවා අවශ්‍ය සත්කාර කළහ. ආශිර්වාද කළහ. ඒ ගුරු දෙගුරුන් මහලු වූ විට ද රෝගී වූ විට ද යුතුකම් ඉටු කළහ. එසේ තම යුතුකම් ඉටු නොකර මඟ හරින්නා පහත් අකෘතඥයකු ලෙස අදටත් අප සමාජය තුළ පිළිගැනේ. තමන්ට උපකාර කළ පැවිදි උතුමන් ද ගුරු දෙගුරුන් හා ඥාතී මිත්‍රාදීන් ද මිය ගිය පසු පින් පෙත් දෙමින් අපේ ඥාතීන් සුවපත් වේවා! යි අප ප්‍රාර්ථනා කරන්නේ ඉමහත් සෙනෙහසිනි: භක්තියෙනි.

## ආගන්තුක සත්කාරය

ආගන්තුකයෝ නම් පිටතින් අප හමුවට පැමිණෙන්නෝ ය. ඔවුන් සාදර ගෞරවයෙන් පිළිගෙන මිහිරි වදනින් සුව පහසු අසුනින් බතින් බුලතින් ඉතා සතුටින් සංග්‍රහ කරන්නන් ලෙස ශ්‍රී ලාංකිකයන් වන අපි ලෝකයේ ප්‍රශංසාවට භාජන වී සිටිමු. අතීතයේ පටන් ම නොයෙකුත් විදේශ රටවලින් මෙරටට ආ එබඳු ආගන්තුකයෝ ලක්වැස්සන්ගේ මේ උසස් ගුණය මහ ඉහළින් අගය කළහ. මෙය ද බුදු සිරිතෙන් හා බුදු දහමින් අප උගත් අගනා පාඩමකි. අපේ මුතුන් මිත්තන් මැනැවින් ක්‍රියාවට නැගූ වටිනා මිනිස් දහමකි. මිනිසුන් වන අප උපයන ධනය අවශ්‍ය යුතුකම් ඉටු කිරීම සඳහා වැය කළ යුතු යැයි බුදුරජාණන් වහන්සේ වදාළහ. ආගන්තුකයන්ට සංග්‍රහ කිරීම ද ඉන් එක් යුතුකමකි. එය බුද්ධ දේශනාවෙහි දක්වෙන්නේ **අතිථිබලි** යනුවෙනි. **බලි** යනු යුතුකම් ය. **අතිථි** යනු ආගන්තුකයන් ය. එසේ ඔවුන්ට අවශ්‍ය සංග්‍රහයෙන් යුතුකම් ඉටු කිරීම ද උපයන ධනයෙන් ගත යුතු ප්‍රයෝජනයකි. විරුද්ධවාදියකු වුව ද ආගන්තුකයාට සත්කාර කළ යුතු යැයි අපේ පුරාණ ආචාර්යවරුන් ද උගන්වා ඇත. එය මනුෂ්‍ය ධර්මයකි. යහපත් මිනිසුන්ගේ උසස් ආචාර ධර්මයකි.

බුදුරජාණන් වහන්සේ ද තමන් වහන්සේ හමුවට එන්නවුන් සාදරයෙන් පිළිගත්හ. "මෙහි එන්න, ඔබේ පැමිණීම ඉතා යහපත්'' යැයි වදාරති. මිහිරි වදනින් අමතති. පිළිසඳර කතා කරති. විවෘත ව අදහස් දක්වති. ''ඉතා නිහතමානී ව තමන් වහන්සේ පළමුව කතා කරති යි". සෝණදණ්ඩ නම් උගත් බමුණකු සිය පිරිසට පැවසූ බව සඳහන් වේ. සුවදුක් විමසීම, සුදුසු අසුනක් පැවරීම, සතුටු සාමීචි කතා කිරීම උන්වහන්සේගෙන් පිළිබිඹු වූ බවත් සූත්‍ර දේශනාවල බොහෝ විට සඳහන් වෙයි. දම් දෙසුමට පළමු එබඳු ප්‍රිය මනාප සිත් ගන්නා සුලු සිරිත් විරිත් ඇති ව අන්‍යාගමිකයන් පවා උන්වහන්සේ විසින් පිළිගන්නා ලදී. ඔවුහු උන් වහන්සේ තම අරමට වැඩම කළ විට ද එලෙසින් ම සාදර ගෞරවයෙන් පිළිගත්හ. සූත්‍ර දේශනාවල හමුවන සේල බ්‍රාහ්මණයා, සකුළුදායී පිරිවැජි, පොට්ඨපාද පිරිවැජි වැන්නවුන් බුදුරජාණන් වහන්සේ විසින් එසේ පිළිගන්නා ලද බව පෙනේ. එය උන්වහන්සේ විසින් ද මැනවින් ආගන්තුකයන් පිළිගැනීම හේතුවෙන් සිදු වූවකි. මෙසේ බුදුරජාණන් වහන්සේගේ අවවාදය මෙන් ම ආදර්ශය ද අනුව යාම ශ්‍රී ලාංකිකයන් ආගන්තුක සත්කාරයෙහි ඉතා උසස් ලෙස නිරත වන්නවුන් ලෙස ඇගයීමට ලක්වීමට හේතු වී තිබේ.

## වැඩිහිටියන්ට සැලකීම

වැඩිහිටියෝ නම් අපට වඩා වයස් ගත වූවෝ ය. ජීවිතයේ බොහෝ අත්දැකීම් ඇත්තෝ ය. දූන් අප කරන කියන දේ අපට කලින් කළ කී ඔවුහු ඒ නිසා ම ජීවිතය පිළිබඳ දැනුමින් ද වැඩිහිටි වෙති. ඔවුන්ගේ අත්දැකීම්වලින් ද දැනුමෙන් ද විවිධ අනුග්‍රහයන්ගෙන් ද පෝෂණය ලබා ගැනීම අපගේ යහපතට නිසැක ව ම හේතු වෙයි. එබැවින් මව්පියන් ගුරුවරුන් පවුලේ වැඩි මහල්ලන් ඇතුළු එම වැඩිහිටියන්ට සත්කාර සම්මාන කිරීම ද ඔවුන්ට ගෞරව කිරීම ද අවශ්‍ය උපකාර කිරීම ද අප සතු උතුම් යුතුකමකි. බුදු දහමෙහි එය හැඳින්වෙන්නේ **වුද්ධාපචායනය** යනුවෙනි. **වුද්ධ** යනු වැඩිහිටියෝ ය. **අපචායනය** යනු ඔවුන්ට ගරු සත්කාර කිරීමයි. නමස්කාර කිරීමයි. එසේ ම ඔවුන් රැකබලා ගැනීමයි. සිය වැඩිහිටියන්ට එසේ සලකන තැනැත්තාට දෙවියන්ගෙන් ද ආශිර්වාදය ලැබෙන බවත් තව්තිසා දෙවියන් විසින් එසේ කටයුතු කරන්නන් සත්පුරුෂයන් ලෙස හඳුන්වනු ලබන බවත් බුදුදහමෙහි දැක්වෙයි. එය එක් අතෙකින් කළගුණ දැක්වීමකි. අනෙක් අතින් යුතුකම් ඉටු කිරීමකි.

එසේ වැඩිහිටියන්ට අවශ්‍ය ගරු සැලකිලි දැක්වීම බුදුරදුන් වදාළ දශ පුණ්‍ය ක්‍රියා වස්තුවලින් ද එකකි. මහා පින්කමෙකි.

පරමාදර්ශී සමාජය වන භික්ෂු සමාජයට මෙම උතුම් ගුණය විශේෂයෙන් ම උගන්වා ඇත්තේ ද එහි ඇති වැදගත්කම නිසා ය. භික්ෂූන් වහන්සේ මහමග වැඩමවන්නේ ද විනයකර්ම දානාදි, පින්කම් ආදියෙහි වැඩ සිටින්නේ ද සඟ මහලු පිළිවෙළිනි. එනම් වැඩිහිටි භික්ෂූන් වහන්සේ මුලින් සිටින පරිදි ය. මහින්දාගමනයෙන් පසු මෙරට ජන සමාජය තුළ මෙම සිරිත තදින් ම තහවුරු විය. අපි භික්ෂූන් වහන්සේ නමක් හෝ මව්පියන් හෝ වැඩිමහලු සහෝදර සහෝදරියන් හෝ වෙනත් ඥාතීන් දුටු විට ද ගුරුවරුන් දුටු විට ද අසුනින් නැගී සිටින්නේ ඒ අනුවයි. ඔවුන්ට කීකරු වන්නේ ද ඇප උපස්ථාන කරන්නේ ද ඒ අනුව යි. එසේ නොකිරීම පාපයකි. යුතුකම් නොදන්නා තැනැත්තා ද මෝඩ අනුවණ උඩඟු තැනැත්තා ද වැඩිහිටියන්ට ගරු නො කරයි. වැඩිහිටියෝ තමන්ට සලකන බාලයින්ට ආශීර්වාද කරති. එය ද අප සමාජයේ ඇති උතුම් ගුණයකි. "තෙරුවන් සරණ දෙවියන් පිහිට මේ ළාබාලයින්ට ලැබේවායි" වැඩිහිටියන් කරන ඒ ආශීර්වාදය අපගේ ම යහපත පිණිස වේ.

## අග්‍රශස්‍ය දානය

අලුත් බත් දානය, අගසස් දානය හෙවත් අග්‍රශස්‍ය දානය ද කෘෂි කාර්මික ජීවිත ගතකළ අපේ මුතුන් මිත්තන් අතර පැවති උසස් දේශීය චාරිත්‍රයකි. කුඹුරුවල අස්වනු නෙළාගත් විට එහි මුල් කොටසින් පිසින ලද දානය අගසස් දානයයි. එය පුදනු ලබන්නේ බුදුරජාණන් වහන්සේට හා භික්ෂූන් වහන්සේලාට ය. තෙරුවන් පිහිට හැර වෙනත් පිහිටක් නැතැයි තදින් පිළිගන්නා ගැමි බෞද්ධයෝ අගසස් දානය මඟින් ඉමහත් සෙතක් සිදුවන බව සලකති. අලුත් සහලින් පිසූ බත අලුත් බත ය. එය අස්වැන්න ලෙස ලත් මුල් ම වී කොටසින් කොටාගත් සහලින් ම පිසින ලද බැවින් අග්‍රශස්‍ය දානය හෙවත් අගසස් දානය ලෙස හැඳින්වෙයි. එම බත සහ ඊට සැහෙන ව්‍යංජන ද ඉතා පිරිසිදු ව සකසා ගන්නා අපේ ගොවියෝ ද ගෙවිලියෝ ද ඉමහත් සතුටින් හා සැදැහැයෙන් වෙහෙරට යති. එහි දී පළමු ව එම අලුත් බතින් බුදුරජාණන් වහන්සේ පුදනු ලැබේ. දෙවනුව භික්ෂූන් වහන්සේලාට දන් පිරිනැමෙයි. මෙය ශ්‍රී ලාංකික ගොවියාගේ අගනා චාරිත්‍රයකි.

ගොවිතැනේ දී තෙරුවන් සිහිකර එම කටයුතු අරඹන ගොවියා දුක් මහන්සියෙන් බොහෝ කැපකිරීම් තුළින් අස්වැන්න නෙළා ගනී. එම සතුට පිරි මොහොතේ දී ද ඔහුට තුනුරුවන සිහිවෙයි. එසේ අස්වැන්නෙහි මුල් කොටසින් තුනුරුවන් පිදීම නිසා ඊළඟ කන්නයේ දී ද තෙරුවන් සරණ ලැබේ යැයි ඔහු පිළිගනියි. මෙබඳු අවස්ථාවන්හි දී දෙවියන්ට ද පින් දීම සිදුවෙයි. එයින් සතුටු වන දෙවියෝ ද ඒ ගොවියන් රකිති. "පිරිසිදු සිතින් කරන කියන දෙයින් සුව සම්පත් ලැබේ ය" යනු බුදුවදන ය.

අතීතයේ මෙරට පොදු ජනයා ඉතා ස්වයංපෝෂිත වූ කෘෂි ආර්ථික රටාවක් ගොඩනඟා ගත්තේ වැඩ කේන්ද්‍ර කොටගත් වී ගොවිතැන තුළිනි. එසේ ම වෙනත් බෝග වගාවන් තුළිනි. මෙරට ගමින් ගම ඉදිකොට තිබූ මහ වැව් දහස් ගණනකි. එසේ ම එම ජනතාව ශ්‍රද්ධාදි උතුම් ගුණයෙන් පරිපෝෂිත වූ දැහැමි දිවි පැවැත්මක් ගොඩනඟා ගත්තේ දාගැබ කේන්ද්‍ර කොට ගත් බෞද්ධ සංස්කෘතිය තුළිනි. එම සංස්කෘතියට පදනම් වූ උතුම් ඉගැන්වීම් තුළිනි. මෙරට ගමින් ගම

ඉදිවුණු සුවිසල් මහ වෙහෙර දාගැබ් පිළිම දහස් ගණනෙකි. අර්ථයෙන් එනම් ආර්ථික වශයෙන් ද ධර්මයෙන් එනම් දැහැමිකමින් ද පෝෂිත වූ ඔවුහු ඉතා සතුටින් හා සාමයෙන් අල්පේච්ඡ වූ ජීවිත ගත කළෝ ය. මෙබඳු ලක්ෂණ ලෝකයේ බොහෝ ජන සංස්කෘතීන්හි දක්නට නො ලැබෙයි. මේ වූකලි ශ්‍රී ලාංකික බෞද්ධ සංස්කෘතියට ම සුවිශේෂී වූ ගුණාංගයෝ වෙති.

### සාරාංශය

මිහිඳු මාහිමියන් ප්‍රධාන ධර්ම දූත පිරිස විසින් අප වෙත දායාද කළ බුදු දහම පරලොවට පමණක් අදාළ වන්නක් හෝ ආත්මාර්ථයට ම යොදා ගත යුත්තක් නො වේ. එහි උසස් සමාජ ධර්ම සමුදායක් ද ඇත. කළගුණ සැලකීම ආගන්තුක සත්කාරය වැඩිහිටියන්ට සැලකීම හා අගසස් දානය ද ඉන් කිහිපයකි. බුදු දහම ඇසුරින් හුරු වූ කරුණාව, මෛත්‍රිය මුල්කොට ගත් මානව සහජීවනය ඇති කරනා මේ සමාජ ධර්ම මෙරට ජන සංස්කෘතියෙහි සුවිශේෂත්වය මැනවින් හෙළි කරයි.

### ක්‍රියාකාරකම

1. අගසස් දානය යනු කුමක් දැයි පැහැදිලි කරන්න.
2. කළගුණ සැලකීම පිළිබඳ බුදුරජාණන් වහන්සේගේ ආදර්ශ දෙකක් පෙන්වා දෙන්න.
3. "ආගන්තුක සත්කාරයෙහි ලැදි අපේ ගැමියෝ" යන මැයෙන් කවියක් සාදන්න.

### පැවරුම

1. ඔබේ පන්තියේ සෙසු අය ද සමඟ පාසල ආසන්නයේ ම ඇති වැඩිහිටි නිවාසයට ගොස් නේවාසිකයන්ට සත්කාර කිරීමේ වැඩ සටහනක් සකස් කරන්න.
2. මෙම පාඩමෙහි ඇතුළත් ගුණධර්ම ඔබ ක්‍රියාත්මක කළ අවස්ථා 'සාධුචර්යා පුස්තකයෙහි' සටහන් කර ගුරුතුමාට පෙන්වන්න.